# ව්‍යවසායකත්ව අධ්‍යයනය

⑤

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11ශ්‍රේණිය

## මූල්‍ය සැලැස්ම

පහත ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුරු යටින් ඉරක් අඳින්න.

1) මූල්‍ය සැලැස්මක් මගින් නිරූපණය නොවන කරුණක් වන්නේ,

I. අපේක්ෂිත ව්‍යාපාරය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය.
II. ව්‍යාපාරය තුළට ගලා එන සහ ව්‍යාපාරයෙන් පිටතට ගලා යන මුදල් ප්‍රමාණය.
III. නිෂ්පාදනය සඳහා වැයවන පිරිවැය ප්‍රමාණයන්
IV. ව්‍යාපාරයේ අපේක්ෂිත ලාභය.

2) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක පහත වියදම් අතරින් ව්‍යාපාරය ආරම්භයට පෙර දරණ වියදමක් වන්නේ,

I. නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීම.
II. සැපයුම්කරුවන් සමග තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා වියදම්.
III. අමුද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වියදම්.
IV. විදුලි බිල්පත් ගෙවීම්.

3) ව්‍යාපෘති පිරිවැය ලෙස හඳුන්වන්නේ,

I. මුළු නිෂ්පාදන පිරිවැයයි.
II. මුළු ආයෝජනය ඇස්තමේන්තුවයි.
III. විකුණුම් හා අලෙවි පිරිවැයයි.
IV. පරිපාලන පිරිවැයයි.

4) ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණය ............................. ලෙස හැඳින්වේ.

I. කාරක ප්‍රාග්ධනය.
II. නිෂ්පාදන වියදම්.
III. පරිපාලන වියදම්.
IV. ස්ථාවර වත්කම්.

5) ව්‍යාපාරයක ඌන කාරක ප්‍රාග්ධන අවස්ථාවකදී ඇතිවිය හැකි තත්වයක් වන්නේ,

I. ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවීම.
II. ක්ෂණික මුදල් සම්පාදනය සඳහා වැඩි පොලියක් ගෙවීමට සිදුවීම.
III. අලෙවි වියදම් ඉහළ යාම.
IV. වෙනත් ආයෝජන අවස්ථා මග හැරී යාම.

6) මුළු ආයෝජන ඇස්තමේන්තුවක ඇතුළත් ශීර්ෂයන් සහ ඊට අදාළ උදාහරණ එකිනෙකට ගැළපෙන පිළිතුර වන්නේ,

| | |
|---|---|
| **A.** ස්ථාවර වත්කම් | **1.** ව්‍යාපාර සැලසුම් සැකසීම. |
| **B.** කාරක ප්‍රාග්ධනය | **2.** විදුලි බිල්පත් ගෙවීම. |
| **C.** නිෂ්පාදන පිරිවැය | **3.** යන්ත්‍ර මිලදී ගැනීම. |
| **D.** ආරම්භයට පෙර වියදම් | **4.** අමුද්‍රව්‍ය මිලදී ගැනීම. |

I. A1, B2, C4, D3
II. A3, B2, D1,C4
III. A1, C4, D1,B3
IV. B4, C2, D1,A3

7) නිශ්චිත කාලච්ඡේදයක් තුළ ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් අතර වෙනස හඳුන්වන්නේ, එම කාලච්ඡේදය අවසාන දිනට ඇති,

I. වත්කම්වල වටිනාකම ලෙස ය.
II. ණය ශේෂය ලෙස ය.
III. ලාභය ලෙස ය.
IV. මුදල් ශේෂය ලෙස ය.

8) පහත් සිද්ධීන් අතුරින් මුදල් ගලා ඒමක් නොවන්නේ,

I. විකුණුම් සඳහා මුදල් ලැබීම.
II. ණය මුදල් ලබා ගැනීම.
III. වත්කම් මිලදී ගැනීම.
IV. අයිතිකරුවන් යොදවන ප්‍රාග්ධනය.

9) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය තුළින් ව්‍යාපාරිකයාගේ කුමන අවශ්‍යතාවයක් සපුරාලයි ද?

I. අවසන් ලාභය පුරෝකථනය කිරීම.
II. ඇස්තමේන්තුගත වත්කම්වල වටිනාකම ගණනය කිරීම.
III. ඇස්තමේන්තුගත ආදායම ගණනය කිරීම.
IV. ඇස්තමේන්තුගත වියදම ගණනය කිරීම.

10) ව්‍යාපාරයක මුදල් ගලා ඒම් සහ ගලා යාම් සම්බන්ධ තොරතුරු ඇතුළත් කර සකස් කරන ලේඛනය වන්නේ,

I. ආදායම් ප්‍රකාශය.
II. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
III. මුළු ආයෝජනය ඇස්තමේන්තුව.
IV. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ප්‍රශ්න අංක 11 සිට 13 දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගන්න.

❖ නිමි ඇඳුම් අලෙවි සැලක් ආරම්භ කිරීමට අපේක්ෂිත නලින්ගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන්, ඉදිරි වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| නලින් විසින් ව්‍යාපාරයට යොදන මුදල | 1 000 000 |
| බැංකු ණය ලබාගැනීම | 500 000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | 3 000 000 |
| සේවක වැටුප් | 200 000 |
| නිමි ඇඳුම් තොග ලබා ගැනීම | 1800 000 |
| ණය වාරික ගෙවීම | 100 000 |
| විදුලි බිල්පත් | 18 000 |
| ගොඩනැගිලි කුලී ගෙවීම් | 100 000 |
| ප්‍රදර්ශනාගාර උපකරණ මිලදී ගැනීම | 450 000 |

11) ඉදිරි වර්ෂය සඳහා නලින් ව්‍යාපාරයේ මුළු මුදල් ගලා ඒම් වල වටිනාකම වන්නේ,

I. රු.1 500 000 II. රු. 3 500 000

III. රු. 4 050 000 IV. රු. 4 500 000

12) ඉදිරි වර්ෂය සඳහා නලින් ව්‍යාපාරයේ මුළු මුදල් ගලා යාම් වල වටිනාකම වන්නේ,

I. රු. 768 000 II. රු. 1 800 000
III. රු. 2 668 000 IV. රු. 3 118 000

13) නලින්ගේ ව්‍යාපාරයේ ඉදිරි කාලච්ඡේදය අවසානයේ ඇස්තමේන්තුගත මුදල් ශේෂය වන්නේ,

I. රු. 968 000 II. රු. 1 832 000
III. රු. 3 568 000 IV. රු. 4 500 000

## 2 කොටස

පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1) මූල්‍ය සැලැස්මක් මගින් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
2) මූල්‍ය සැලැස්මක අන්තර්ගත ප්‍රධාන කොටස් නම් කරන්න.
3) ව්‍යාපාර ආරම්භයට පෙර දැරීමට සිදුවන වියදම් සඳහා උදාහරණ දෙකක් සපයන්න.
4) මුළු ආයෝජන ඇස්තමේන්තුවක අන්තර්ගත කොටස් නම් කරන්න.
5) ව්‍යාපාරයක සිදුවිය හැකි මුදල් ගලා යාම් සඳහා උදාහරණ හතරක් සපයන්න.
6) ව්‍යාපාරයක ඇස්තමේන්තුගත මුළු වියදම් ප්‍රධාන අංශ දෙකක් යටතේ වර්ග කර දක්වයි. එම අංශ දෙක නම් කර ඒ එක් එක් අංශ සඳහා උදාහරණ සපයන්න.

7) පහත සිද්ධිය අධ්‍යයනය කර අදාළ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

පවතින Covid 19 වසංගත තත්වය හමුවේ තම පියාගේ රැකියාව අහිමි වීමත් සමඟ දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින පවුලක එකම දියණිය වන වත්සලා උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව තම පවුල ඇදවැටී ඇති ආර්ථික අපහසුතාවයෙන් මුදවා ගැනීමේ දැඩි අධිෂ්ඨානයෙන් යුතුව අලුතින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළාය.

එහිදී තම අධ්‍යාපනයෙන් ලද දැනුම යොදාගනිමින් විවිධ ව්‍යාපාර අදහස් අතුරින් වඩාත් යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් ලෙස ''වීසි ඊසි'' නමින් ආහාර සැකසුම් ආයතනයක් ආරම්භ කිරීමටත්, එම ආහාර අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතා කරමින් මංගත ක්‍රමයට (online) අලෙවි කිරීමටත් අදහස් කරයි.

මේ සඳහා තම පියා කලක් තිස්සේ විදේශීය අවන්හලක සේවය කිරීමෙන් ලත් දැනුමත් , මවගේ ආහාර පිසීමේ හැකියාවත් වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීමට ඇය අදහස් කරයි. ව්‍යාපාරය සඳහා ඇය තම පියා සතු නිවසට යාබදව ඇති රු. 500 000 ක් පමණ වටිනා ගොඩනැගිල්ල ද, රු. 600 000 ක් වටිනා ත්‍රීරෝද රථය ද යොදා ගැනීමට අපේක්ෂා කරන අතර ව්‍යාපාරයේ මූළුතැන්ගෙය සඳහා අවශ්‍ය ආහාර සැකසුම් උපකරණ මිලදී ගැනීම සඳහා රු.1 000 000 ක බැංකු ණයක් ගැනීමට අපේක්ෂා කරයි.

මීට අමතරව පහත වියදම් දැරීමට සිදුවේ යැයි අපේක්ෂා කරයි.

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ලට අවශ්‍ය පරිදි විදුලිය සපයා ගැනීම සඳහා | 15 000 |
| ජල සැපයුම් සඳහා | 5 000 |
| ලියාපදිංචි ගාස්තු සඳහා | 3 000 |
| ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම් සඳහා | 7 000 |
| දෛනිකව ව්‍යාපාර කටයුතු සඳහා | 20 000 |
| දෛනික සේවක වැටුප් සඳහා | 5 000 |

ඉහත තොරතුරු ඇසුරින්,

I. වත්සලා සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් නම් කරන්න.
II. වත්සලාගේ ව්‍යාපාරය සතු ශක්තීන් දෙකක් දක්වන්න.
III. ස්ථාවර වත්කම්වල වටිනාකම ගණනය කර දක්වන්න.
IV. ආරම්භයට පෙර මුළු වියදම් ගණනය කර දක්වන්න.
V. කාරක ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න.
VI. ඇස්තමේන්තුගත මුළු ආයෝජනය කොපමණද?

8) ''ග්‍රීන් ඇග්‍රෝ'' ආයතනයේ ඉදිරි වර්ෂය සඳහා ඇස්තමේන්තුගත තොරතුරු පහත පරිදි වේ.

| | | රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | | 250 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය - | කොම්පෝස්ට් | 50 000 |
| | පොලිතින් මලු | 5 000 |
| | පොහොර වර්ග | 35 000 |
| ශ්‍රම පිරිවැය - | පුහුණු | 24 000 |
| | නුපුහුණු | 12 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | | 20 000 |
| විකුණුම් හා බෙදා හැරීමේ වියදම් | | 3 000 |
| මූල්‍ය වියදම් (ණය පොළිය) | | 3 000 |

ඉහත ව්‍යාපාරයේ ,

I. මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
II. මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.
III. ශුද්ධ ලාභය/ අපේක්ෂිත ප්‍රතිඵලය ගණනය කරන්න.